කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective
Established 1984

# 2021.10.11 වන දින පාලර්මේන්තු වෙබ් අඩවියේ පළ කරන ලද ප්‍රකාශය සඳහා ප්‍රතිචාරය

මැතිවරණ නීති සහ මැතිවරණ ක්‍රමයේ නිසි ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමටත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන නිදෙර්ශ කිරීමටත් පත් කරන ලද පාලර්මේන්තු විශේෂ කාරක සභාව විසිනි

---

කඩිනමින් පළාත් සභා මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය නීතිමය සංශෝධන සිදු කිරීමට ඉහත පාලර්මේන්තු විශේෂ කාරක සභාව විසින් තීරණය කර ඇති බව අපට දැනගැනීමට ලැබුණි. පළාත් සභා මැතිවරණය පැරණි මැතිවරණ ක්‍රමය යටතේ පවත්වනු ලැබිය හැකි බව පාලර්මේන්තු වෙබ් අඩවියෙහි වාතර්ා කරයි.

පැරණි මැතිවරණ ක්‍රමයේ කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා කිසිදු විශේෂ විධිවිධානයක් නොතිබුණි. කෙසේ වුවද යම් සංශෝධන ක්‍රියාවලියක් මගින් පළාත් පාලන මට්ටමෙන් කාන්තා නියෝජනය බරපතල ලෙස අඩු වීමට පිළියමක් ගෙන ඒමට අවශ්‍ය බව අප විශ්වාස කරන්නෙමු.

පැරණි මැතිවරණ ක්‍රමය යටතේ පළාත් සභාවල වැඩි කාන්තා නියෝජනයක් තහවුරු කිරීම සඳහා 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 13(1) වන වගන්තියට පහත දැක්වෙන සංශෝධනය ගෙන එන ලෙස අප යෝජනා කරන්නෙමු.

*යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ (මෙහි මින්මතු "ස්වාධීන කණ්ඩායමක්" යනුවෙන් සඳහන් කරනු ලබන) ස්වාධීන අපේක්ෂකයන් වශයෙන් තරග කරන යම් තැනැත්තන් කණ්ඩායමක් හෝ විසින්, පරිපාලන දිස්ත්‍රික්කයකින් පළාත් සභාවක මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ කායර්ය සඳහා, ඒ පරිපාලන දිස්ත්‍රික්කයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට තුනක් එකතු කරන ලද විට ලැබෙන සංඛ්‍යාවට සමාන අපේක්ෂක සංඛ්‍යාවක්, ඔවුන්ගේ නම්වල ප්‍රමුඛත්වය අනුව දැක්වෙන එක් නාමයෝජනා පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය. ඒ නාම යෝජනා පත්‍රය මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.*

***එසේ වුවද, එම ලැයිස්තු ඉදිරිපත් කිරීමේ දී එක් එක් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින්, නාමයෝජනා කරනු ලබන සමස්ත අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් සියයට විස්සකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තා අපේක්ෂිකාවන් විය යුතු ය.***

මෙම ඉදිරිපත් කිරීම පසුගිය වසර 25ක කාලයක සිට මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන් සමග සම්බන්ධව කටයුතු කරමින් සිටින කාන්තා සංවිධාන විසින් පවත්වන ලද උපදේශක සාකච්ඡා මත පදනම්ව ඇති අතර පහත දැක්වෙන අය විසින් පිටසන් කර ඇත:

කුමුදිනී සැමුවෙල්, කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
සුමිකා පෙරේරා, ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය, කුරුණෑගල දිස්ත්‍රික්කය
චන්ද්‍රා ජයසිංහ, කාන්තා සංවධර්න මධ්‍යස්ථානය, බදුල්ල දිස්ත්‍රික්කය
පොන්නයියා ලෝගේස්වරී, කාන්තා සහයෝගීතා පෙරමුණ මහනුවර දිස්ත්‍රික්කය
ශ්‍රියානි පතිරගේ, ගැමි කාන්තා පෙරමුණ ,ගාල්ල දිස්ත්‍රික්කය
මෛත්‍රී රාජසිංහම්, විළුදු, උතුරු සහ නැගෙනහිර දිස්ත්‍රික්ක

56/1, සරසවි මාවත, කාසල් වීදිය, කොළඹ 8, ශ්‍රී ලංකාව
சரசவி லேன், காசல் வீதி, கொழும்பு 8, இலங்கை.
Sarasavi Lane, Castle Street, Colombo 8, Sri Lanka

Telephone: +94-11-2690192, 5632045, 5635900, 5635800, 2690201, Fax: +94-11-2690192, 2690201, Email: wmcsrilanka@gmail.com
www.womenandmedia.org facebook.com/womenandmediacollective twitter.com/womenandmedia

Registration No. GA 2476

පිටපත්:

1. ගරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන - මැතිවරණ නීති සහ මැතිවරණ ක්‍රමයේ නිසි ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමටත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන නිදේශ කිරීමටත් පත් කරන ලද පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සභාපති
2. සභිකයින් - මැතිවරණ නීති සහ මැතිවරණ ක්‍රමයේ නිසි ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමටත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන නිදේශ කිරීමටත් පත් කරන ලද පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව
3. ගරු අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් - රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය
4. ගයනි ප්‍රේමතිලක මෙය - නීති නිලධාරී, රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
5. පක්ෂ නායකයින්
6. පක්ෂ ලේකම්වරු